**දුරකථන**/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, **Fax**: 2784846

ඊමේල්: ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය

**கல்வி அமைச்சு**

**Ministry of Education**

"ඉසුරුපාය",
ශ්‍රීජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல

"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. }

**මගේ අංකය** / எமது இல. / My No. } ඊඩී/3/අති.ලේ/සැලසුම්/102

දිනය / திகதி / Date } 2011 මැයි මස 10 දින

**චක්‍රලේඛ අංක: 2011/17**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප හා කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන්, පරිවෙණාධිපතිවරුන් වෙත.

**<u>අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනකි</u>**

## <u>පාසල් ළමා ආරක්ෂක කමිටු - "සුරැකුම් පවුර"</u>

රටක අනාගතය හෝ සමාජ සංවර්ධනය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයක් වනුයේ එහි ළමා පරපුරයි. දැනුමින්, කුසලතාවන්ගෙන් හා සුභවාදී ආකල්පයන්ගෙන් පාසල තුළින් සුපෝෂිත වන ළමුන් වයස අවුරුදු 18 සම්පූර්ණ වීමත් සමග සමාජානුයෝජනය වනුයේ යහපත් පුරවැසියන් වශයෙනි. මනා පෞරුෂයකින් හෙබි එවැනි මිනිසෙකු රටකට අමිල සම්පතකි.

පාසල් සිසුවෙකුගේ හෝ සිසුවියකගේ දෛනික සක්‍රිය කාල සීමාවෙන් හරි අඩක්ම හෝ ආසන්න කාලයක් පාසල තුළ ගත කරයි. එබැවින් ළමයෙකුගේ සංවර්ධනය විෂයෙහි පාසලකට ඇත්තේද ප්‍රබල වගකීමක් හා කාර්යභාර්යයකි. ළමයෙකු යනු පහසුවෙන් අපයෝජනය සඳහා ගොදුරු කරගත හැකි පුද්ගල කොට්ඨාශයකි. නොමේරූ මනස, සමාජීය අත්දැකීම් දුලබවීම, මොළය වර්ධනය වෙමින් පැවතීම, නිවසේ දී සිදුවන හිංසා පීඩා, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මව පියා වෙන්ව සිටීම, නිසි ආදරයක් සෙනෙහසක් නොලැබීම, ජීවත්වන පරිසරය දුරාචාරයට නැඹුරු වී පැවතීම වැනි සාධකයන් මත මෙකී ළමා පරපුර තව තවත් අනාථ අසරණ තත්වයට පත්වන අතරම දවසින් දවස ඔවුන්ගේ පෞරුෂත්වය හීනකරමින් අපයෝජනයන් වෙත ළඟා වීමට ඇති ප්‍රවණතාව අති ප්‍රබලය.

පාසල් ගෙට්ටුවෙන් පාසලට අවතීර්ණ වීමත් සමගම සෑම සිසුවෙකුගේම සිසුවියකගේම භාරය හා ආරක්ෂාව ඔහු හෝ ඇය එම පරිශ්‍රයෙන් පිටව යන තෙක්ම විදුහල්පතිවරයා සහ ආචාර්ය මණ්ඩලය මෙන්ම පාසලේ සහයක කාර්ය මණ්ඩලය විසින් ද දැරිය යුතුය. ඒ අනුව ළමුන් සියලු අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරගැනීම එකී සමස්ත කාර්ය මණ්ඩලයේ පරම වගකීමකි. තම රාජකාරියේම කොටසකි. සදාචාරාත්මක යුතුකමකි.

ළමයෙකුගේ සංවර්ධනයට බාධාවන අයුරින් කායිකව, මානසිකව හෝ ලිංගිකව හිංසනයකට පීඩනයකට ලක් කිරීමට මෙන්ම තම නෛතික වගකීම පැහැර හැරීමෙන් හෝ නොසැලකිලිමත්කමෙන් ළමයෙකු එකී හිංසනයකට හෝ පීඩනයකට ගොදුරු වුවහොත් එය ළමා අපයෝජනයක් වශයෙන් අර්ථ විවරණය කළ හැකිය.

මෙලොව එළිය දකින බිළිඳෙකු වයස අවුරුදු 18 සම්පූර්ණ කොට යහපත් මිනිසෙකු ලෙස සමාජ ගතවීමට, සුපෝෂිතවත් වීමට ලැබිය යුතු සාධකයන් කවරේද? අදවන විට විශ්වයම මෙම සාධකයන් ළමා අයිතිවාසිකම් ලෙස පිළිගෙන ඇත. එකී සාධකයන් එකිනෙක ගිලිහී යාමේ දී මිනිසා සමාජානුයෝජනය වනුයේද, විවිධ දුර්වලතා සහිතවය. එකී දුර්වලතාවයන් සමාජයට මහත් විනාශයක් සිදු කිරීමට මුල බීජයකි. ශ්‍රී ලංකාව 1990.01.20 වන දින එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් තබා 1991.07.12 වන දින මෙරට ළමුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරදීමට එම ප්‍රඥප්තිය නිල වශයෙන් පිළිගෙන ඇත. එබැවින් ඔබ අප එයට ගරු කළ යුතුව ඇත.

ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හා ළමා අපයෝජනය ළමයෙකුගේ පෞරුෂත්වය හීන කරන ප්‍රබල සාධකයන් වේ. එබැවින් දැනුම, කුසලතා සහ ආකල්පයන්ගෙන් පිරිපුන් මනා පෞරුෂත්වයකින් හෙබි දරුවන් බිහි කිරීම පාසලක මුඛ්‍ය පරමාර්ථය විය යුතුය.

ළමා අපයෝජනයන් පිළිබඳව සොයා බැලීමේදී ළමා අපයෝජනයන් වර්ධනය වීමට පහත සාධකයන් හේතු කාරක වී ඇතැයි හඳුනා ගත හැකිය.

- වයසට සාපේක්ෂව ලිංගික අධ්‍යාපනයක් නොලැබීම
- ළමුන් අපයෝජනයන්ගෙන් ආරක්ෂා වීමට නොදැන සිටීම
- ළමා අපයෝජනය යන්න කුමක්දැයි හඳුනා නොගැනීම
- ළමා අයිතිවාසිකම් පිළිබඳව නොදැනුවත්භාවය
- ළමුන් ආරක්ෂා කිරීමට ඇති ආයතන හා නිලධාරීන්ගේ වගකීම් පැහැර හැරීම
- තම ගැටළුව, ප්‍රශ්නය පැවසීමට උපදෙස් ලබා ගැනීමට විශ්වාසවන්ත කෙනෙකු නොමැති වීම
- අපයෝජනයන්ට ගොදුරු වුවහොත් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ළමුන් නොදැන සිටීම
- පෞරුෂ වර්ධනය දුර්වල වී තිබීම
- පවුල් සංස්ථාව තුළ විවිධ ගැටලුකාරී තත්වයන් උද්ගත වීම

අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කිරීමටත් ළමා අපයෝජනයන් වැළැක්වීම සඳහාත් අපයෝජනයන්ට ගොදුරු වූ දරුවන්ට ප්‍රතිකාර කිරීම සඳහාත් පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතින් ස්ථාපනය කරන ලද්දකි. එම අධිකාරියේ පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩ පිළිවෙල පාසලේ දී මෙන්ම ඉන් පරිබාහිරව ද සිදුවන ළමා අපයෝජනයන් පිටුදැකීමටත් ළමා හිතකාමී අධ්‍යාපන පරිසරයක් පාසල තුළ ඇතිකිරීම සඳහාත් සෑම තැන්හිම ළමුන් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරගැනීමටත් මනා පෞරුෂයකින් හෙබි ළමා පිරිසක් නිර්මාණය කිරීම සඳහාත් අත්‍යන්තයෙන්ම වැදගත් කටයුත්තක් යැයි මා විශ්වාස කරමි. එබැවින් පහත සවිස්තරාත්මකව දැක්වෙන පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩපිළිවෙල හා එකී අධිකාරියේ කාර්යභාර්ය සාර්ථක කරගැනීම සඳහා සහය ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම අවැසි සහයෝගය ලබා දීමට වග බලා ගත යුතුය.

පාසල් ළමා ආරක්ෂක කමිටුව **"සුරැකුම් පවුර"** නම් වන අතර එහි අරමුණු පහත පරිදි වේ.

1. සියලු ආකාරයේ ළමා අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කර ගැනීම
2. විවිධාකාරයේ අපයෝජනයන්ට ගොදුරුවී ඇති දරුවන් පාසල තුළ සිටී නම් ඉතා රහසිගත ලෙස හඳුනා ගැනීමත් එකී දරුවන්ට අවශ්‍ය රැකවරණය සහ ආරක්ෂාව සහතික කිරීමත් නීතිය ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය දැනුවත් කිරීම

3. අධ්‍යාපන කාර්යයේදී පසුගාමී දරුවන් පංති මට්ටමෙන් හඳුනා ගැනීමත් ඊට බලපා ඇති සමාජ, ආර්ථික සාධක සහ පවුල් පසුබිම හඳුනා ගැනීම පිණිස කටයුතු කිරීම, අවශ්‍ය උපදේශනය ලබාදීම, පසුවිපරම සහ සම්පත් ඌනතාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය යොමු කිරීම
4. විශේෂ මානසික හෝ කායික අවශ්‍යතා සහිත දරුවන්ට උපකාර කිරීම
5. දරුවන්ගේ මානසික ආතතිය අවම කිරීමට බලපාන නිර්මාණාත්මක සහ චිකිත්සක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. දරුවන්ගේ ප්‍රීතිමත් හැඟීම් සහ දුක්බදායී අත්දැකීම් ප්‍රකාශ කිරීම සහ හුවමාරු කිරීම සඳහා අවස්ථාවක් ලබා දීම
7. දරුවන්, දෙමාපියන් සහ ගුරුවරුන් අතර සහසම්බන්ධතාව ඉහළ නැංවීම
8. දරුවන්ට සවන් දීම
9. දරුවන්ගේ ආරක්ෂාව සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සේවය සහ සම්බන්ධීකරණය නිරතුරුව ලබා දීම
10. පාසල් දරුවන් දුම්පානය, මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය, ලිංගික අපචාර සහ අනෙකුත් දුශ්චර්යාවන්ට යොමු වීම වැළැක්වීම
11. විනය ගරුක හැසිරීම් සම්බන්ධයෙන් පාසල් දරුවන්ට ඇති වගකීම අවබෝධ කරවීම සහ සුහවාදීව ඔවුන්ගේ පෞරුෂය ගොඩනැංවීම
12. විනයගරුක ළමා හිතකාමී පාසල් පරිසරයක් නිර්මාණය කිරීම
13. පූර්ණ පෞරුෂයකින් හෙබි පුරවැසියන් ජාතියට උරුම කරදීම

මෙම පාසල් ළමා ආරක්ෂක කමිටුවල සංයුතිය පහත පරිදි විය යුතුය.

කමිටුවේ සාමාජිකයන් 10-40 දක්වා සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සංඛ්‍යාව පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තෝරාගත යුතුය.

| ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු සාමාජික සංඛ්‍යාව | ශිෂ්‍යයින් නියෝජනය | ගුරු මණ්ඩල නියෝජනය | දෙමාපිය නියෝජනය |
|---|---|---|---|---|
| 200 ට අඩු | 10 | 6 | 2 | 2 |
| 200-500 | 20 | 14 | 3 | 3 |
| 500-1000 | 30 | 22 | 4 | 4 |
| 1000 ට වැඩි | 40 | 30 | 5 | 5 |

**කමිටුවේ සංයුතිය**

ශිෂ්‍ය නියෝජනය 6 වසරේ සිට උසස් පෙළ දක්වා විදුහල්පතිගේ අභිමතය පරිදි පත් කල යුතුය. පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක සහ නායිකාව කමිටුවේ නිත්‍ය ශිෂ්‍ය සාමාජිකයින් ලෙස ඉහත ශිෂ්‍ය නියෝජනය සඳහා ඇතුලත් විය යුතුය

මනා විනයකින් හෙබි, සිසු සිසුවියන් සමග සුහදව ක්‍රියාකරන හා සිසු සිසුවියන්ගේ ආදරය දිනාගත් ගුරු භවතුන් ගුරු මණ්ඩල නියෝජනය සඳහා පත් කළ යුතු අතර ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත්වන ගුරුවරුන් සඳහා ප්‍රමුඛත්වය හා විශේෂත්වයක් ලබා දිය යුතුය. අවම වශයෙන් එක් ගුරුවරයෙකු හෝ නියෝජනය විය යුතුය. විදුහල්පතිවරයා විසින් අදාල ගුරුවරුන් පත්කිරීම සිදු කළ යුතු වේ.

පාසල් සංවර්ධන සමිතිය හරහා ළමා අපයෝජන චෝදනාවන් නොමැති සදාචාර සම්පන්න දෙමාපියන් දෙමාපිය නියොජනය සඳහා විදුහල්පතිවරයා විසින් පත් කළ යුතුය.

සෑම වසරකටම වරක්ම කමිටු සාමාජිකයින් පත් කළ යුතු අතර මුළු සාමාජිකයින්ගෙන් 1/3 ක ගේ විරෝධතාවක් නොමැති නම් සාමාජිකත්වය දිගටම දැරිය හැකිය. යම් සාමාජිකයෙකු සම්බන්ධයෙන් විරෝධතාවයක් ඇත්නම් එයට හේතු දක්වා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා වෙත පැමිණිලි කළ හැකි වේ. රහසිගත පරීක්ෂණයකින් අනතුරුව අධිකාරියේ සභාපතිවරයා විසින් තවදුරටත් එම තැනැත්තා සාමාජිකත්වය දැරිය යුතුද යන්න පිළිබඳ නිර්දේශයක් ලබා දිය යුතුය.

මෙම කමිටුවේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික උප සභාපති, උප ලේකම් හා කාරක සභිකයින් 5 දෙනෙකු ද සිසු සිසුවියන් අතුරින් පත්කල යුතුය. කමිටුවේ සියලු වාර්තා ලේකම් විසින් පවත්වාගත යුතු අතර සියලු රැස්වීම් වාර්තා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අදාල දිස්ත්‍රික් සම්බන්ධීකාරක වෙත යොමු කළ යුතුය.

### කමිටු රැස්වීම

සෑම මාසයකටම එක් වතාවක් බැගින් අවම වශයෙන් එක් පාසල් වාරයකට තුන් වතාවක් රැස්විය යුතුය.

### උපදේශකත්වය

කමිටුවේ ප්‍රධාන උපදේශක පාසලේ විදුහල්පතිවරයා විය යුතුය. ඔහුගේ අභිමතය මත නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු හෝ අංශප්‍රධාන ගුරුවරයෙකු ඒ සඳහා පත් කළ හැකිය.

### සම්බන්ධීකරණය

පාසලේ ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා පත් කළ ගුරුවරයා හෝ සිසු සිසුවියන්ගේ ප්‍රසාදයට පත් ගුරුවරයෙකු මේ සඳහා සුදුසු වේ. එකී සම්බන්ධීකාරක විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සම්බන්ධීකාරක හා/හෝ දිස්ත්‍රික් මනෝ සමාජීය සම්බන්ධීකාරක සමග සම්බන්ධීකරණය පවත්වා ගත යුතු අතර ඔවුන් පළාත්, කළාප, කොට්ඨාශ මට්ටමේ අධ්‍යාපන බලධාරීන් සමග සෘජු සම්බන්ධතා පවත්වනු ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සෘජුවම දිස්ත්‍රික් ලේකම්වරයා හරහා අධිකාරියේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා සහ මනෝ සමාජීය සම්බන්ධීකරණ නිලධාරියා මගින් පාසල් ළමා ආරක්ෂක කමිටු සම්බන්ධීකරණය කරනු ඇත.

### කමිටුවේ ක්‍රියාකාරකම්

1. ළමා අපයෝජනය පිටුදැකීම සහ ළමුන්ගේ ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්
2. මනෝසමාජීය ක්‍රියාකාරකම්
3. පෞරුෂ සංවර්ධන වැඩසටහන්
4. නායකත්ව පුහුණු වැඩසටහන්
5. සෞන්දර්ය සහ රසාස්වාදනය ඉහළ නැංවීමේ ක්‍රියාකාරකම්
6. දරුවන්ගේ විනය සංවර්ධනය කරන වැඩසටහන්
7. දත්ත කළමනාකරණය ආශ්‍රිත වැඩසටහන්
8. සිසුන් වැඩි පිරිසක් දුර්වලතා දක්වන සහ ප්‍රධාන විශයන් හි දැනුම සංවර්ධනය සඳහා නූතන ක්‍රමවේදයන් ආශ්‍රිත වැඩසටහන්
9. විභාග ක්‍රියාකාරකම් පදනම් කරගත් වැඩසටහන් සහ කාල කළමනාකරණ වැඩසටහන්

10. ළමුන්ගේ හැගීම්, අනන්‍යතාවය සුරැකෙන පරිදි ප්‍රකාශකිරීම සහ අදාල නිලධාරීන් වෙත දැනුවත්කිරීම සඳහා සිනහ කඳුළු (**Happy and Sad Box**) පෙට්ටියක් පවත්වාගෙන යාම
11. කමිටුව විසින් හඳුනා ගන්නා වෙනත් සුදුසු වැඩසටහන්
12. පාසල් ළමා ආරක්ෂක කමිටු ක්‍රියාකාරකම් ඇගයීම උදෙසා කොට්ඨාශ, කලාප, පලාත් හා ජාතික මට්ටමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

කමිටුවේ ක්‍රියාකාරකම් සඳහා කමිටුවේ යෝජනා සම්මතයෙන් අරමුදල් රැස්කිරීම හා එකී ක්‍රියාකාරකම් සඳහා එම මුදල් යොදවා ගැනීම විදුහල්පතිවරයාගේ අධීක්ෂණය හා අනුමැතිය සහිතව සිදු කළ යුතුය. මෙලෙස රැස්කරන මුදල් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකොට ඊට අනුබද්ධ වැය ශීර්ෂයක් ලෙස පවත්වාගත යුතුය.

අප රටේ ළමා පරපුර සියලු අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරගැනීමත් තම ළමා කාලය තුළ ලැබිය යුතු ළමා අයිතිවාසිකම් තහවුරු කරදීමත් සඳහාත් අවැසි සියලු ක්‍රියාමාර්ගයන් පාසල විසින් ගත යුතුය. පාසල් ළමා ආරක්ෂක කමිටු මගින් මෙම කටයුත්ත වඩාත් පහසුවෙන් ඉටුකරගත හැකි බැවින් සෑම පාසලකම පාසල් ළමා ආරක්ෂක කමිටුවක් ස්ථාපනය කිරීම හා එය පවත්වාගෙන යාම සෑම විදුහල්පතිවරයෙකුගේම වගකීමක් බැව් අවධාරණය කර සිටිමි.

පාසලේ ආචාර්ය මණ්ඩලය හා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු නිලධාරීන් මෙම පාසල් ළමා ආරක්ෂක කමිටුව සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කල යුතු අතර පාසල් අධීක්ෂණ ක්‍රියාවලියේ දී අදාල නිලධාරීන් විසින් පාසල් ළමාරක්ෂක කමිටුවේ ක්‍රියා කාරීත්වය අධීක්ෂණය කළ යුතුය. මෙම පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ඔබ සියලු දෙනාගේ ම පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

එච්.එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත - සභාපති - දැ.ගැ.පි/අ.ක.ස
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
නො. 330 තලවතුගොඩ පාර, මාදිවෙල.